# අපූරු මිතුදම



සනුත්තරා රුක්මල්දෙණිය

# අපූරු මිතුදම

සනුත්තරා රුක්මල්දෙණිය

# අපූරු මිතුදම

© සනුත්තරා රුක්මල්දෙණිය
කර්තෘ ප්‍රකාශනයකි


| | |
|---|---|
| ප්‍රථම මුද්‍රණය | : 2025 ජනවාරි |
| ISBN | : 978-624-208-631-6 |
| කර්තෘ | : සනුත්තරා රුක්මල්දෙණිය |
| චිත්‍ර | : සනුත්තරා රුක්මල්දෙණිය |
| පරිගණක අක්ෂර සහ ග්‍රැෆික් නිර්මාණයකරණය | : අචනි රණසිංහ - නෙත්වින් ප්‍රින්ටර්ස් |
| මුද්‍රණය | : ''දළදා සෙවණේ අපි පදනම''<br>ගැටඹේ හන්දිය, මහනුවර<br>081 2 386 908 |

# පිදුම

පින්බර මහාමායාවේ සිප්සතර හදාරන්නට භාග්‍යවන්ත වූ මා හට මහාමායාවේ සුන්දර පුෂ්පයක් සේ විකසිත වී ගුණ සුවඳ විහිදුවාලන්නට සිප් සයුරේ කිමිද සියල්ල අතැඹුලක් සේ දැනගන්නට මාගේ සිත් අහසේ උදා හිරු කිරණ ඔබ මැයි ගුරු මෑණියනි. . . . .

මාගේ පන්ති භාර ගුරුතුමිය ලෙස, සදා යෝධ සෙවණැල්ලක් සේ මා හට පිටුවහලක් වූ ඔබ ලැබීම මාගේ භාග්‍යයක්ම විය.

එසේ හෙයින් මාගේ පන්තිභාර ගුරුමෑණියන් වන වත්සලා අමරසේන ගුරුමෑණියන් වෙත ඉතා තුති සිතින් හා ඉතා ගෞරවයෙන් මාගේ මේ පොත් පිංච පුද දෙමි.

# ස්තූතිය

මා විසින් මුල්වරට ලියන ලද ''අපූරු මිතුදම'' නම් මෙම පොත් පිංච සාර්ථකව නිම කර ගැනීම සඳහා මා හට ගුරුහරුකම් දෙමින් මාව දිරිමත්මත් කල මාගේ ආදරණීය දෙමාපියන්ටත්, පන්ති භාර ගුරුතුමිය වන වත්සලා අමරසේන ගුරු මෑණියන්ටත්, මෙම කෘතිය සාර්ථකව නිමකර ගැනීමට අතහිත දුන් ව්‍යාපෘති සම්බන්ධීකාරකතුමන් ඇතුළු සියළු දෙනාටම මාගේ ගෞරවාදර ස්තූතිය මෙයින් පුද කරමි.

සනුත්තරා රුක්මල්දෙණිය

3 ශ්‍රේණිය B

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන ''හෙරණගත්කරණී'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,<br>
ශශිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකෝමත් එක ගමක හිටියා සිත්මි කියලා ලස්සන ගෑනු ළමයෙක්. එයා හරිම ලස්සනයි. කොන්ඩේ දිගම දිගයි. ඇස් නිල්ම නිල් පාටයි.



එයාගේ හොඳම යාළුවා තමයි නෙත්මි. ඒ දෙන්නා පොඩි කාලේ ඉඳලම හොඳම යාළුවෝ.

හැබැයි නෙත්මි, සිත්මි වගේ ගොඩක් ලස්සන නෑ. පාටින් ටිකක් අඩුයි. පොකුටු කොට කොණ්ඩයක් එයාට තිබුණේ.

හැබැයි ඒ හැමදේටම හරියන හරිම ලස්සන හිතක් නෙත්මිට තිබුණා. නෙත්මිගෙ යාළුවා සිත්මි නම් ලස්සන වුණාට ටිකක් නපුරැයි, හැම වෙලේම කාගේ හරි හිත රිදෙන වචන තමයි කියන්නේ, හැබැයි එයා නෙත්මිට නම් නපුරු කම් කලේ නෑ.



එක දවසක් මේ දෙන්නා පාරේ යනකොට බලු පැටියෙක් දැක්කා. ඒ බලු පැටියාගේ තුවාල ගොඩායි.

නෙත්මි ඒ බලු පැටියාව අතට ගන්න හැදුව විතරයි, සිත්මි නෙත්මිට මෙහෙම කිවුවා.

"පිස්සුද ඔයාට, මේ බලු පැටියා හරිම අපිරිසිදුයි, තුවාල ගොඩායි, පණුවොත් ඉන්නවා, අපි එයාව පාරේ දාලා යමු."

"අනේ සිත්මි, මට නම් එහෙම  කරන්න බෑ, එයා හරිම පව්, මම එයාව ගෙදර ගෙනියනවා."

මේක අහපු සිත්මි, මූණ නපුරු කරගෙන පොලවේ අඩි හප්පලා මෙහෙම කිව්වා.

"මේ වගේ කැතම කැත බල්ලෙක් අල්ලනවා නම් මම මීට පස්සෙ ඔයා එක්ක කතා කරන්නවත් කැමති නෑ." මෙහෙම කියපු සිත්මි, නෙත්මිව එතනම දාලා යන්න ගියා.



නෙත්මි අර බලු පැටියාව හරිම ආදරෙන් වඩාගෙන ගෙදර අරන් ගිහින් නාවලා තුවාල වලට බෙහෙත් දැම්මා. හොඳ කෑම ජාති කන්න දුන්නා. එයා ටිකෙන් ටික සුවපත් වුනා.

මෙහෙම ටික කාලයක් ගත වුනා. දවසක්
සිත්මි පාසල් යනකොට පාර අයිනෙන් ඇවිදගෙන
ගියපු එයාව කාර් එකකින් හප්පාගෙන ගියා.
එයාගේ කකුල කැඩුණා, කාලයක් බෙහෙත් කරන්න වුනා.

මේක එයාගේ යාළුවා නෙත්මිට ආරංචි වුනා. එයාට
හරිම දුකයි. එයා පලතුරු ගොඩක් අරගෙන සිත්මිව
බලන්න පිටත් වුනා. දැන් එයා යන හැම තැනම එයාගෙ
පුංචි බලු රාළත් යන්න පුරුදු වෙලා. නෙත්මි එයාට
දාපු ලස්සන නම තමයි බිංදු.

ඉතින් නෙත්මියි බිංදුයි සිත්මිගේ ගෙදරට ගියා,
සිත්මි හරිම පව්, ඇඳෙන් බහින්න වත් බෑ. ගොඩ
දවසකින් නාලත් නෑ. අර ලස්සන කොණ්ඩේ කුණු
පිරිලා. නෙත්මි ආවහම සිත්මිට ඇඬුණා.



සිත්මිට හිතා ගන්න බෑ බිංදු ලස්සන වෙලා තියන හැටි දැකලා. එයාටත් හරිම සතුටුයි.

එයා කිව්වා, "නෙත්මි, මටත් එයාට වගේ ඉක්මනට සනීප වෙයි නේද?"

"අනේ ඔව් සිත්මි, ඔයාටත් ඉක්මනට ආය පාසල් යන්න පුළුවන් වෙයි. අද ඉඳලා, අපි තුන්දෙනාම හොඳම යාළුවෝ.

එයාට මතක් වුණා, අර බලු පැටියා ගැන කියලා නෙත්මිට බැණපු විදිය.

එයා අඬ අඬා නෙත්මිගෙන් සමාව ගත්තා.

"අනේ නෙත්මි මට සමාවෙන්න. මම ඔයත් එක්ක බොරුවට තරහා වුනේ. දැන් මමත් හරියට ඔයා බේරගත්ත බලු පැටියා වගේ වෙලා, ඒත් එයා තරහා අමතක කරලා මාව බලන්න ආවා නේද?

නෙත්මිට හරිම දුකයි යාළුවාව දැකලා, එයා කිව්වා "ඕවා අමතක කරන්න සිත්මි, මේ ඉන්නේ බිංදු, දැන් එයත් ඔයාගේ යාළුවෙක්.

සිත්මිටයි, නෙත්මිටයි, බිංදුටයි තුන්දෙනාටම හරිම සතුටුයි. බිංදු වලිගය වනලා, රවුමක් කැරකිලා එයාගෙ ආදරේ පෙන්නුවා.

එයාලා හැමදාමත් සතුටින් හිටියා.




# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

**සනුත්තරා රුක්මල්දෙණිය**
**කර්තෘ**



9 786242 086316